**වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | වාහන සේවා මධ්‍යස්ථානයේ අයිතම 06ක භාණ්ඩ 36ක තොග වටිනාකම රු.153,600ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රංග ශාලාවේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අවසන් කිරීමට ප්‍රථම රු.596,200ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කිරීමෙන් ස්ථාවර වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | එම | එම |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,946,076ක් වටිනා ගිණුම් විෂයයක් භෞතික පැවැත්ම, උපලේඛන සහ ඊට අදාළ අනෙකුත් සාක්ෂි නොතිබීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ස්ථාවර වත්කම් ලේඛනය තුළ ඇතුලත් කර ඇති බව. | වටිනාකම තහවුරු කළ හැකි ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම. | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 571 (2) | | වර්ෂ 02කට වඩා කල් ඉකුත් වූ රු.184,446ක තැන්පත් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තැන්පත් ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | | | |
| | (i) | අංක 59 රීතිය | කර්මාන්ත/ ව්‍යාපාර පිළිබඳ සෑම වර්ෂයකම ආරම්භයේදී ආදායම් පරීක්ෂක/ ආදායම් පරිපාලක හෝ ලේකම්වරයා විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී සමීක්ෂණ කටයුතු සිදු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) | අංක 218 රීතිය | සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා හා සභාව විසින් පදිංචියට ගන්නා ලද සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සෑම වර්ෂයකට වරක් සමීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂා කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාල සමීක්ෂණයට අවශ්‍ය ලිපි ලේඛන මේවනවිට සකස් කරගෙන යන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,606,618ක් වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,232,699ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 2,793 | 2,035 | 718 | 3,394 | 2,712 | 2,389 | 415 | 3,303 |
| කුලී | 107,626 | 70,540 | 70,130 | 897 | 60,254 | 40,586 | 18,061 | 7,601 |
| බලපත්‍ර ගාස්තු | 479 | 471 | 469 | 371 | 417 | 603 | 435 | 370 |
| වෙනත් ආදායම් | 6,082 | 4,625 | 4,093 | 1,016 | 29,253 | 31,399 | 29,946 | 2,439 |
| එකතුව | 116,980 | 77,671 | 75,410 | 5,678 | 92,636 | 74,977 | 48,857 | 13,713 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු.968,833ක්, හිඟ අක්කර බදු රු.235,230ක්, හිඟ ජල බදු රු.1,818,518ක්, හිඟ ව්‍යාපාර බදු රු.371,000ක්, හිඟ කඩකුලී රු.896,657ක් සහ හිඟ බලපත්‍ර ගාස්තු රු.370,500ක් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේ දී අය කිරිමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.800,665ක් හා මුද්දර ගාස්තු රු.3,371,623ක්ද ඉකුත් වර්ෂයේ මුද්දර ගාස්තු රු.547,385ක ශේෂයක්ද විය. | ලිපි මගින් අවශ්‍ය ඉල්ලීම් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන පිළිසරු ව්‍යාපෘති අරමුදල් ගිණුමට අදාළ රු.150,842ක මුදල නිෂ්ක්‍රීයව පැවතුණි. | නිෂ්ක්‍රියව පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | නීති ප්‍රකාරව ගිණුම වසා දැමීමට හෝ මුදල් භාවිතයට ගැනීම සිදුකළ යුතුය. |
| (ආ) | ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ සවිකර තිබූ Huler යන්ත්‍රයේ මෝටරය 2021 වර්ෂයේද Crusher යන්ත්‍රයේ මෝටරය 2022 වර්ෂයේද සොරාගෙන තිබූ අතර මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පොලිස් ස්ථානාධිපති තුමාට ලිඛිතව දැනුවත් කර ඇති බව. | අදාළ ක්‍රියාමාර්ගගත යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු. 10,861,011ක් වූ අතර ඒ තුළ වර්ෂ 05 ක් ඉක්ම වූ රු.532,310ක ශේෂයක්ද විය. | ඉදිරියේ දි අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.18,198,767ක් වූ අතර ඉන් වර්ෂ 05කට වැඩි රු.3,267,698ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දි නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | අවසන් වරිපනම් තක්සේරුව 2018 වර්ෂයේදී වන අතර නව තක්සේරුවක් සිදුකර ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු තක්සේරුවක් සඳහා කටයුතු කරන බව. | වරිපනම් බදු ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු වෙනුවෙන් සමීක්ෂණයක් සිදු කර අදාළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂය සඳහා සමීක්ෂණ කටයුතු සිදු කරගෙන යන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කඩ කාමර 42ක ගිවිසුම් කාලය ඉකුත් වී තිබූ අතර යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු මේවනවිට ආරම්භ කර ඇති බව. | ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභා තීරණයක් මඟින් පවරා ගෙන ඇති කඩ කාමර 13ක් බදු දී නොමැති වීම හේතුවෙන් සභාවට ආදායම් අහිමි වී තිබුණි. | බදුකරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් සභාවට ආදායම් අහිමිවී තිබුණ බව. | කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල,පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේදී මිලදීගත් එකතුව රු.3,087,700ක් වූ කාය වර්ධන උපකරණ තොගය හා එම කාය වර්ධන උපකරණ ස්ථාපිත කර ඇති මධ්‍යස්ථාන 02 භාවිතා කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | වනාතවිල්ලුව කායවර්ධන මධ්‍යස්ථානය මේ වන විට ප්‍රයෝජනයට ගන්නා අතර, කරතිව් කායවර්ධන මධ්‍යස්ථානය බදු දීමට කටයුතු කරන බව. | කාය වර්ධන උපකරණ තොගය හා එම කාය වර්ධන උපකරණ ස්ථාපිත කර ඇති මධ්‍යස්ථාන 02 කඩිනමින් ආදායම් උත්පාදන කටයුතු සඳහා යොදා ගත යුතුය. |
| (ආ) | වනාතවිල්ලුව ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය හා එහි උපකරණ භාවිතයට නොගැනීම හේතුවෙන් දිරාපත් වෙමින් පැවතුණි | ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයක් පවතින බව. | රජයේ අරමුදල් වැය කර ඉදි කරන ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගත යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල පවරා නොගත් දේපළ 50ක් පැවැති අතර ඒ තුල සුසාන භූමි, ක්‍රීඩා භූමි, පෙර පාසල්, පුස්තකාල, ජල පොම්පාගාර හා සතිපොළවල් විය. | ඉදිරියේදී එය පවරා ගැනීම කඩිනමින් කරන බව. | අදාළ දේපළ පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ තෘතීයික තනතුරු 01කද ද්විතියික තනතුරු 07ක්ද හා ප්‍රාථමික තනතුරු 01ක්ද පුරප්පාඩු වී තිබුණි. | පවතින සේවක පුරප්පාඩු සම්පූර්ණ කරගැනිමට ඉදිරියේදී කටයුතු කරන බව. | සභාවට අවශ්‍ය සේවක ප්‍රමාණය නිවැරදිව හඳුනා ගෙන එම සේවක ප්‍රමාණය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පසුගිය වර්ෂවලදී සේවය හැර ගිය, විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය සේවකයින් 10 දෙනෙකුගෙන් රු.393,478ක ශේෂයක් අයවිය යුතුව තිබුණි. | මේ වනවිට රු.169,215 මුදල් අය වී ඇති බව. | අයවිය යුතු සේවක ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 වාහන පද්ධතිය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ විශේෂ සමීක්ෂණයක් මඟින් ට්‍රැක්ටර් රථය අපහරණය කිරීමට යෝජනා කර ඇති නමුත් අපහරණය නොකර දිරාපත් වෙමින් පැවතුණි. | පළාත් පාලන කොමසාරිස්තුමා දැනුවත් කර ඇතිබව. | විශේෂ සමීක්ෂණ වාර්තා නිර්දේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | වනාතවිල්ලුව ප්‍රාදේශිය ලේකම් විසින් 2011 වර්ෂයේදී මාස 03ක කාලයක් සඳහා ට්‍රැක්ටරයක් සහ ජල බවුසරයක් සභාවට ලබා දී තිබූ අතර එම ට්‍රැක්ටරය හා ජල බවුසරය විධිමත්ව ආපසු භාරදීමට කටයුතු නොකර සභා භූමියේ ගාල් කර දිරාපත් වෙමින් පැවතුණි. | විධිමත් පරිදි නැවත භාරගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්තුමා දැනුවත් කර ඇති බව. | විධිමත්ව ආපසු භාරදීමට කටයුතු තළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරි සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 07ක් ඉටු කිරීම සඳහා රු.119,595ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි. | වැයකරන ලද මුදල් ප්‍රමාණයට අපේක්ෂිත නිමවුම ලබා ගැනීමට නොහැකි වූ බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කර නිමවුම් මට්ටම අත්පත් කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී කර්තව්‍යයන් 16ක් සඳහා රු.4,600,000ක ප්‍රතිපාදන සලසා තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන රු.3,700,000ක වටිනාකමැති කර්තව්‍යයන් 09ක් අත්හැර දමා තිබුණි. | කර්තව්‍යයන් අත් හැර හොයන්නට හැකි උපරිම ලෙස කටයුතු කිරීම අවශ්‍යා බවට අදාල නිළධාරින් දැනුවත් කර ඇති බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කර නිමවුම් මට්ටම අත්පත් කර ගැනීමට කටයුතු කල යුතුය. |

### 4.2 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල අයවැය ඇස්තමේන්තු මගින් වැය විෂයයන් 27කට අදාළව සලසා තිබුණු රු.1,943,000ක සම්පූර්ණ ප්‍රතිපාදනයම අදාළ අයවැයගත කාර්යයන් ළඟා කර ගැනීම සඳහා භාවිතා කර නොතිබුණි. | අනපේක්ෂිත හේතුන් මත අදාළ වැය දැරීමට නොහැකි වී ඇති බව. | අයවැය ගත ඉලක්ක සපුරා ගැනීමට හැකි අයුරින් මෙහෙයුම් කටයුතු සැලසුම් කළ යුතුය. |
| (ආ) | තවද සමාලෝචිත වර්ෂයට අදාළව වැය විෂයයන් 25ක් සඳහා රු.94,297,198ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් වැයකර තිබුණේ සියයට 50කටත් අඩු ප්‍රමාණයකි | එම | එම |

### 4.3 තිරසාර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| "එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේදී එයට අනුගත වී නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදිව කටයුතු කිරීමට වග බලා ගන්නා බව. | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව අදාළ අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |